THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
# ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## කළමනාකරණ සහකාර (MA)

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP) යනු ලෝක බැංකුවේ (WB) අරමුදල් මගින් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. සමස්ත ව්‍යාපෘති පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් වන අතර, 2024-2028 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක හරහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය සහ එහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) කළමනාකරණ සහකාර තනතුර කොන්ත්‍රාත් පදනම මත පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මුලින් වසරක කාලයක් සඳහා බඳවා ගන්නා අතර, සතුටුදායක කාර්ය සාධනය සහ ව්‍යාපෘති අවශ්‍යතා මත පදනම්ව වාර්ෂිකව දීර්ඝ කළ හැකිය. උපරිම සේවා කාලය 2028.12.31 දිනෙන් අවසන් වන අතර, රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් සඳහා කිසිදු හිමිකමක් නොමැත. වැටුප් සහ අනෙකුත් අදාළ නියමයන් සහ කොන්දේසි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2026 පෙබරවාරි 02 දිනැති අංක 01/2026 චක්‍රලේඛයේ 3.2.3 ඡේදයට අනුකූල වේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | අධ්‍යාපනික සුදුසුකම් |
|---|---|---|
| කළමනාකරණ සහකාර (පූර්ණ කාලීන) | 02 | **බාහිර අයදුම්කරුවන්:**<br>● අ.පො.ස. (උ/පෙළ) - විෂයයන් 03 යි<br>● අ.පො.ස. (සා/පෙළ) - සිංහල/දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව අවම වශයෙන් සම්මාන සාමාර්ථ 04 ක් සහිතව එක් වරකදී විෂයයන් 06 ක් සමත් වීම.<br>**අභ්‍යන්තර අයදුම්කරුවන් (රාජ්‍ය සේවය):**<br>● ඉහත සඳහන් කළ උ/පෙළ සහ සා/පෙළ සුදුසුකම්.<br>● ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.<br>● දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.<br>*** විද්‍යාවේදී (BSc.) උපාධියක් තිබීම විශේෂ සුදුසුකමකි.**<br><br>**පළපුරුද්ද:**<br>කාර්යාල පරිපාලන / ගිණුම් / ප්‍රසම්පාදන / ව්‍යාපෘති පරිපාලන හෝ ඊට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් තිබීම වඩාත් සුදුසුය. රජයේ හෝ ආධාර අරමුදල් සහිත ව්‍යාපෘතිවල පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.<br>**වෙනත් අවශ්‍යතා:**<br>පරිගණක සාක්ෂරතාවය (MS Office), සාමාන්‍ය තොරතුරු තාක්ෂණ යෙදුම් භාවිතය, හොඳ සන්නිවේදන කුසලතා (සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි), කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව, යහපත් චරිතය සහ ශාරීරික හා මානසික යෝග්‍යතාවය. |

**ව්‍යාපෘති විස්තර සඳහා කරුණාකර https://phsep.lk වෙත පිවිසෙන්න.**

අධ්‍යාපනික, පළපුරුද්ද සහ වෙනත් සුදුසුකම්වල පිටපත් අමුණා ඇති සවිස්තරාත්මක ජීවදත්ත සටහනක් (CV) හෝ ජීව දත්ත (විශේෂ ආකෘතියක් නොමැත), සම්බන්ධ කර ගත හැකි දුරකථන/ෆැක්ස්/විද්‍යුත් තැපැල් ලිපිනය සමඟ "APPLICATION FOR THE POST OF MANAGEMENT ASSISTANT" (කළමනාකරණ සහකාර තනතුර සඳහා අයදුම්පත) යන ශීර්ෂය යටතේ ලියාපදිංචි තැපැලෙන් (පමණක්) පහත ලිපිනයට **2026 මාර්තු 06** දින හෝ ඊට පෙර එවිය යුතුය.

**ලිපිනය:**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP),**
**191 ඒ, ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, "බංගලාව" ධර්මපාල මාවත, කොළඹ 07.**
**විද්‍යුත් තැපෑල:** info@phsep.lk **දුරකථන:** 0112 271150

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, කුසලතා සහ නිපුණතා සපුරාලන්නේ නැති, ප්‍රමාද වූ, අසම්පූර්ණ, උපකාරක ලේඛන අමුණා නොමැති, ලියාපදිංචි තැපැල හැර වෙනත් ක්‍රම මගින් (විද්‍යුත් තැපැල, අතින් භාරදීම හෝ වෙනත් ලිපිනයකට) යවන ලද අයදුම්පත් සලකා බලනු නොලබන අතර ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP).**
**2026 පෙබරවාරි 20 දින**